02039



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

බෞද්ධ ශිෂ්ටාචාරය I
பௌத்த நாகரிகம் I
Buddhist Civilization I

**45 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** පිළිතුර තෝරාගෙන එය **පිළිතුරු පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** බුද්ධකාලීන භාරතයේ ජනප්‍රියව සිටි ශාස්තෘවරුන් අතුරින් 'මරණින් මතු සත්ත්වයාගේ පැවැත්මක් නැත' යි ඉගැන්වූයේ,

(1) පූරණ කස්සප ය. (2) පකුධ කච්චායන ය.
(3) අජිත කේසකම්බල ය. (4) මක්ඛලී ගෝසාල ය.
(5) නිගණ්ඨනාතපුත්ත ය.

**2.** පහත දැක්වෙන්නේ බුද්ධකාලීන භාරතීය ආගමික විශ්වාස පිළිබඳ ප්‍රකාශ කිහිපයකි.

A - ඊශ්වර නිර්මාණවාදය ප්‍රාග් බෞද්ධ යුගයේ සිටම දැඩිව මුල් බැසගෙන පැවතුණි.
B - 'අකිරියං මහාරාජ' යනුවෙන් අක්‍රියවාදී ඉගැන්වීමක් ඉදිරිපත් කළේ පූරණ කස්සප විසිනි.
C - ඉන්ද්‍රඛීලයක් සේ ස්ථිර වූ පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුඛ, දුක්ඛ සහ ජීව යන සප්ත කායවාදයක් ඉදිරිපත් කරන ලද්දේ පකුධ කච්චායන විසිනි.
D - චාතුයාම සංවරය ජෛන සම්ප්‍රදායට අයත් ඉගැන්වීමකි.
E - මුසාවාද භය නිසා පිළිතුරු නොදී සිටීම සංජයවාදයේ එක් ලක්ෂණයකි.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,

(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) A, B සහ C පමණි.
(4) A, B, C සහ D පමණි. (5) A, B, C, D සහ E යන සියල්ල ම ය.

**3.** බුද්ධකාලීන භාරතයේ වාණිජකරණය සහ නාගරීකරණය මුල් කොට ගෙන ඇති වූ සමාජ හා ආර්ථික සංවර්ධනය සඳහා බලපාන ලද එක් ප්‍රධාන හේතුවක් ලෙස හඳුනාගත හැක්කේ,

(1) දේව නිර්මාණවාදය පදනම් කරගත් බ්‍රාහ්මණ ඉගැන්වීම මගින් හඳුන්වාදුන් ස්වධර්ම සංකල්පය මැනවින් ක්‍රියාත්මක වීමයි.
(2) වහල් සේවයට එරෙහිව කුල හීනයන්ගේ නැඟී සිටීමයි.
(3) ශ්‍රමණ සම්ප්‍රදාය විසින් සාම්ප්‍රදායික බ්‍රාහ්මණ ඉගැන්වීම් දැඩි ලෙස විවේචනය කරනු ලැබීමයි.
(4) නව සිටුවර පන්තියක් බිහි වී වෙළඳපොළ පදනම් කරගෙන ආර්ථිකය කළමනාකරණය කිරීමයි.
(5) මත්ස්‍ය න්‍යාය අනුව බලවත් රාජ්‍ය, අසල්වැසි කුඩා රාජ්‍යයන් යටත් කොට ගෙන පාලන ප්‍රදේශ පුළුල් කර ගැනීමයි.

**4.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) දන් දීම බ්‍රාහ්මණ වර්ණයට අයත් ස්වධර්මයක් නොවී ය.
(2) කාමභෝගය පිළිබඳ වගකීම පැවරී තිබුණේ ක්ෂත්‍රියයන්ට ය.
(3) ගෘහස්ථ ආශ්‍රමයේදී ත්‍රිවේද අධ්‍යයනය අනිවාර්ය විය.
(4) බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය යන වර්ණ තුනටම යාග කිරීමේ අයිතිය තිබුණි.
(5) ආපද්ධර්ම අවස්ථාවලදී ක්ෂත්‍රියයන්ට බ්‍රාහ්මණ ස්වධර්මවල නිරත වීමට අවසර තිබුණි.

5. "රාජ භටයන් පැවිදි නොකළ යුතුය" යන විනය නීතිය බුදුරජාණන් වහන්සේ විසින් පනවන ලද්දේ ....................... රජුගේ ඉල්ලීමකට අනුව ය.

(1) සේනිය බිම්බිසාර (2) පසේනදී කොසොල් (3) අජාසත්ත
(4) උදේන (5) චණ්ඩපජ්ජෝත

6. පහත සඳහන් ප්‍රකාශ අවධානයෙන් කියවන්න.

A - බුද්ධකාලීන මගධ රාජ්‍යය ගිජ්ඣකූටය ආදී පර්වත පහකින් වට වී තිබීම නිසා 'ගිරිබ්බජ' නමින් ප්‍රකට විය.

B - උදේන රජු බුද්ධකාලීන වත්ස රාජ්‍යයේ පාලකයා විය.

C - මහා කච්චායන තෙරුන්ගෙන් බණ අසා චණ්ඩපජ්ජෝත රජු තෙරුවන් සරණ ගියේ ය.

D - වජ්ජි රාජ්‍යයේ ගණතන්ත්‍ර පාලන ක්‍රමයක් ක්‍රියාත්මක විය.

E - බුදුරජාණන් වහන්සේ දහනව වසක් කොසොල රාජ්‍යයේ වැඩ විසූහ.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,

(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) A, B සහ C පමණි.
(4) A, B, C සහ D පමණි. (5) A, B, C, D සහ E යන සියල්ල ම ය.

7. ඇදහිය හැකි තරම් ඇති උපාසිකාවන්ගෙන් අග්‍රස්ථානය ලැබූ ....................... සොළොස් වසරක් තිස්සේ ගෘහස්ථ බ්‍රහ්මචර්යාව ආරක්ෂා කළා ය.

(1) සාමා (2) උප්පලවණ්ණා (3) විසාඛාව
(4) බන්ධුල මල්ලිකාව (5) නකුල මාතාව

8. බුද්ධකාලීන මහ තෙරුන් වහන්සේලා කිහිප නමක් හා සම්බන්ධ ප්‍රකාශ පහක් පහත දැක්වේ.

A - සතර ඉරියව්වෙන් තොරව වීර්ය වඩා රහත් විය.

B - අවබෝධ ශක්තිය ඇති භික්ෂූන් අතර අග්‍රස්ථානය ලැබීය.

C - හැකිළු දහම් කරුණු සරල ලෙස විස්තර කිරීමේ හැකියාව පැවතියේ ය.

D - බහුශ්‍රැත භික්ෂූන් අතර අග්‍රස්ථානය ලැබීය.

E - පිරිනිවන් පෑමට පෙර තම මැණියන් සෝවාන් ඵලයෙහි පිහිටුවිය.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් ආනන්ද මහරහතන් වහන්සේගේ චරිතය සම්බන්ධ තොරතුරු පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) A, B සහ C (2) A, B සහ D (3) A, B සහ E (4) B, C සහ D (5) B, C සහ E

9. "බුදුරජාණන් වහන්සේ අපේ කාලය වාසනාවේ පිපුණු මලයි. ඒ මල විකසිත වන්නේ අසීමිත ලක්ෂ සංඛ්‍යාත වසර ගණනාවකට පසුව ය. එයින් විහිදෙන ප්‍රඥා සුගන්ධයෙන් ඇද නැගෙන දයාව නමැති මීපැණි මකරන්දයෙන් ලෝකය පිරෙයි."

ඉහත ප්‍රකාශය කවරෙකු විසින් සිදු කරන ලද්දක් ද?

(1) මහාචාර්ය ලක්ෂ්මි නරසු
(2) එඩ්වින් ආර්නෝල්ඩ්
(3) මහාචාර්ය මැක්ස් මුලර්
(4) බර්ට්‍රන්ඩ් රසල්
(5) ඇල්බට් අයින්ස්ටයින්

10. සත් ලොව සත ලෙසට
දැනගෙන හොඳින් දහමට
දෙසුමෙන් නියම මතට
....................... .......

ඉහත පද්‍යයෙන් විස්තර වන බුදුගුණය කුමක් ද?

(1) සුගත (2) සම්මාසම්බුද්ධ (3) ලෝකවිදූ
(4) භගවා (5) විජ්ජාචරණ සම්පන්න

11. සක්විති රාජ්‍ය පාලනය පිළිබඳව ඉතා වැදගත් තොරතුරු අඩංගු 'චක්කවත්තිසීහනාද' සූත්‍රයට අනුව සක්විති රජතුමා විසින් තම පසුව පත්වන අනුප්‍රාප්තික රාජ්‍ය පාලකයන්ට දෙනු ලබන උපදේශය වන්නේ,
(1) පැවසූ ප්‍රතිඥාවේ පිහිටා රාජ්‍ය පාලනය සිදු කළයුතු බවයි.
(2) දිළිඳුනට ධන දැමීමට ක්‍රියා කළයුතු බවයි.
(3) සිය රාජ්‍යයෙහි අපරාධ මර්දනය විධිමත්ව සිදු කළයුතු බවයි.
(4) චක්‍රවර්ති රාජ්‍යය පියාගෙන් පුතුට උරුම වන දායාදයක් නොවන බවයි.
(5) පක්ෂීන් සිව්පාවුන් සහ සමස්ත ජනතාව සඳහා දැහැමි ආරක්ෂාවරණය සැලසිය යුතු බවයි.

12. "අම්හාකං සාලීනං භාගං අනුප්පදස්සාම" යනුවෙන් දැක්වෙන්නේ,
(1) ධන සම්පත් කළමනාකරණය පිළිබඳ ඉගැන්වීමකි.
(2) පාලකයා විසින් ජනතාව වෙනුවෙන් ඉටු කළයුතු යුතුකමකි.
(3) ගෘහපතියා විසින් සමාජය වෙත ඉටු කළයුතු යුතුකමකි.
(4) ජනතාව විසින් රජයට ඉටු කළයුතු යුතුකමකි.
(5) ධනෝපායනය පිළිබඳ ඉගැන්වීමකි.

13. දුර්භික්ෂ ආදී ආපදාකාරී අවස්ථා කරණ කොට ගෙන ජනතාව දුක් පීඩාවලට පත්ව ඇති අවස්ථාවල පාලක පක්ෂය විසින් ජනතාව මත බදු බර නොපැටවිය යුතු බව අවධාරණය කරන ඉගැන්වීම ඇතුළත් වන්නේ,
(1) අග්ගඤ්ඤ සූත්‍රයේ ය.
(2) චක්කවත්තිසීහනාද සූත්‍රයේ ය.
(3) මහා පරිනිබ්බාන සූත්‍රයේ ය.
(4) අම්බට්ඨ සූත්‍රයේ ය.
(5) කූටදන්ත සූත්‍රයේ ය.

14. දැහැමි පාලකයකු තුළ තිබිය යුතු ගුණධර්ම දහයක් ජාතක පාලියේ දැක්වෙන අතර, ඒවා දසරාජ ධර්ම නමින් හැඳින්වේ. පාලකයා ආත්මාර්ථකාමී නොවී අවංකව ක්‍රියා කළයුතු වීමත්, මහජනයාගේ දුක් පීඩාවන් පිළිබඳ සංවේදීව කටයුතු කළයුතු වීමත් එම දස රාජධර්මවලින් දෙකකි. එම රාජධර්ම දෙක ඇතුළත් වරණය කුමක් ද?
(1) ඉවසීම - මෘදුබව
(2) ක්‍රෝධ නොකිරීම - ඍජුබව
(3) පරිත්‍යාගය - ඍජුබව
(4) ඍජුබව - මෘදුබව
(5) අවිහිංසාව - මෘදුබව

15. සමාජ හෝ පාලන තන්ත්‍රයක් පරිහානියට පත්වීමට බලපාන ප්‍රධාන සාධකයක් ලෙස බලවතුන්ට චෝදනා කර ගනිමින් සමගිය බිඳ වැටෙන සේ ක්‍රියා කිරීම හඳුන්වා දිය හැකි ය. යහපත් රාජ්‍ය පාලනයේදී සමගිව කටයුතු කිරීමේ වැදගත්කම බෞද්ධ දේශපාලන දර්ශනය තුළ අවධාරණය කොට ඇත. මෙම ඉගැන්වීම ඇතුළත් බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්මය ................................ නමින් හැඳින්වේ.
(1) දස සක්විතිවත්
(2) සතර අගතියෙන් වැළකීම
(3) දස රාජධර්ම
(4) පඤ්ච සීලය
(5) සප්ත අපරිහානීය ධර්ම

16. නිදහසේ ජීවත්වීමේ අයිතිය, පුද්ගලිකව දේපළ සතු කර ගැනීමේ අයිතිය හා නිරවුල් පවුල් ජීවිතයක් ගත කිරීමේ අයිතිය සුරක්ෂා කර දීමට දිරිදෙන ඉගැන්වීම ඇතුළත් බෞද්ධ සදාචාර ධර්මය හැඳින්වෙන්නේ,
(1) පඤ්ච සීලය නමිනි.
(2) නීති ගරුකත්වය නමිනි.
(3) සිවු බඹ විහරණ නමිනි.
(4) සමාජ සහජීවනය නමිනි.
(5) ලෝක පාලක ධර්ම නමිනි.

17. රියසකට කඩ ඇණය මෙන් සමාජයේ යහපැවැත්ම උදෙසා උපයෝගී වන බෞද්ධ සදාචාරමය මූලධර්මයක් ලෙස සිඟාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන්නේ,
(1) සතර කර්මක්ලේශ ය.
(2) සතර සංග්‍රහ වස්තූ ය.
(3) සතර බ්‍රහ්ම විහරණ ය.
(4) සතර අගතියෙන් තොරවීම ය.
(5) සතර සම්‍යක් ප්‍රධාන ය.

[හතරවැනි පිටුව බලන්න

18. "කැඩපතකින් තමාගේ තම සිරුර නිරීක්ෂණය කරන්නා සේ තම කායික, වාචසික, මානසික ක්‍රියා ප්‍රත්‍යවේක්ෂා කළ යුතු ය." අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ ඉගැන්වෙන මෙම ධර්මෝපදේශයෙන් .................. සඳහා වැරදි ක්‍රියාවන්ගෙන් ඈත්වීමට උපදෙස් ලැබේ.

(1) තමාට සිදුවන හානිය
(2) අනුන්ට සිදුවන හානිය
(3) තමා හා අනුන් යන උභය පක්ෂයට සිදුවන හානිය
(4) මෙලොව පරලොව දෙකටම සිදුවන බව
(5) ලෝභ, දෝෂ, මෝහ වැඩිවන බව

19. සිඟාලෝවාද සූත්‍රගත 'ඡ අපාය මුඛ' හෙවත් භෝග විනාශ වීමේ දොරටු සයට අයත් **නොවන්නේ**,

(1) ස්ත්‍රීන්ට ලොල්වීමයි.
(2) සුරාවට ලොල්වීමයි.
(3) සූදුවට ලොල්වීමයි.
(4) පාපමිත්‍ර සේවනයයි.
(5) අලසකමයි.

20. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක්වෙන පරිදි සම්පත් පරිභෝජනයෙහිලා අද්දුමාරික හෙවත් බොහෝ සම්පත් තිබියදීත් නොකා නොබී මිය යන සිත පරිභෝජනයත්, උදුම්බරඛාදික හෙවත් දිඹුල් ඵල කන්නා සේ සිදු කරනු ලබන විනාශකාරී අධිපරිභෝජනයත් බුදුසමය බැහැර කරයි. එහිලා සම්පත් පරිභෝජනය හා කළමනාකරණය පිළිබඳ බුදු සමයේ නිර්දේශය ලෙස හඳුනාගත හැක්කේ,

(1) මධ්‍යම ප්‍රතිපදාවයි.
(2) සම්මා ආජීවයයි.
(3) පඤ්ච බලී සංකල්පයයි.
(4) සමජීවිකතාවයි.
(5) භෝග සුඛයයි.

21. "සිත්කලු වූ වෘක්ෂයෝ පිපුණු මල් ඇත්තාහු නාන්පස සියලු දිශාවන්හි සුවඳ හමන් පරණලා හැර පල ගැනීමට ලං වූවාහු ය. වීරයන් වහන්ස, මෙයින් නික්ම යාමට කල්වෙයි."
ථෙර ගාථා පාලියේ එන මෙම ප්‍රාකෘතික වර්ණනාව සිදු කරන ලද්දේ,

(1) සංකිච්ච හිමියන් විසිනි.
(2) වංගීස හිමියන් විසිනි.
(3) සප්පක හිමියන් විසිනි.
(4) වනවච්ඡ හිමියන් විසිනි.
(5) කාළුදායි හිමියන් විසිනි.

22. මල්පල උයන් වවන්නෝ වෙත් ද
වන වගා කොට දෙන්නෝ වෙත් ද
ඒ දඬු පාලම් කරවන්නෝ වෙත් ද
පැන් හල්, පැන් පොකුණු ආවාස ඉදි කොට දෙත් ද
මේ ආදී පරිසර සංරක්ෂණ කටයුතු සිදු කරන අයට ලැබෙන ආනිසංස ලෙස සංයුක්ත නිකාය වනරෝප සූත්‍රයේ දක්වා ඇත්තේ,

(1) දෙලොව සතුටුවන බවයි.
(2) නිවනින් සැනසීම උදාවන බවයි.
(3) දිවා රෑ පින් වැඩෙන බවයි.
(4) පරලොව සුගතියෙහි උපදින බවයි.
(5) සිහි මුළාවීමකින් තොරව කළුරිය කරන බවයි.

23. ධන සම්පත් කළමනාකරණය පිළිබඳ සිඟාලෝවාද සූත්‍රගත උපදේශය මගින් බුදුසමය නිර්දේශ කොට ඇත්තේ උපයන ලද සම්පත් කොටස් හතරකට බෙදා පරිහරණය කළ යුතු බව ය. ඒ අනුව පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) දෙකොටසක් පරිභෝජනයටත්, ආයෝජනයට හා සංරක්ෂණයට එක් කොටස බැගිනුත් යෙදවිය යුතු බවයි.
(2) දෙකොටසක් සංරක්ෂණයටත්, පරිභෝජනයට හා ආයෝජනයට එක් කොටස බැගිනුත් යෙදවිය යුතු බවයි.
(3) දෙකොටසක් ආයෝජනයට වෙන් කොට, ආය-වැය සමව පවත්වා ගෙන යා යුතු බවයි.
(4) ආයෝජනයට සහ සංරක්ෂණයට මෙන්ම මහණ බමුණන්ට දන්දීම ආදී පරලොව හිත පිණිස ද කොටසක් වෙන් කළ යුතු බවයි.
(5) දෙකොටසක් ආයෝජනයටත්, පරිභෝජනයට හා සංරක්ෂණයට එක් කොටස බැගිනුත් යෙදවිය යුතු බවයි.

24. 'සච්චවාදිං අලිකවාදිනං' යන ධම්මපද ගාථා ඛණ්ඩයේ අර්ථය වනුයේ,
(1) බොරු කියන්නා සත්‍යයෙන් දිනිය යුතු ය. යන්නයි.
(2) බොරු කියන්නා විශ්වාස කළ නොහැකි ය. යන්නයි.
(3) සත්‍යය සදා ජය ගනියි. යන්නයි.
(4) සත්‍යයෙන් මිස අසත්‍යයෙන් කිසිවක් දිනිය නොහැකි ය. යන්නයි.
(5) සත්‍යයෙන් සුගතියට ද බොරුවෙන් දුගතියට ද පමුණුවයි. යන්නයි.

25. මංගල සූත්‍රයෙහි සඳහන් වන 'බාහුසච්චං' යන්නෙහි අර්ථය කුමක් ද?
(1) සැබවින් සත්‍යවාදී වීම
(2) චතුරාර්ය සත්‍යය දැකීම
(3) බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව
(4) ශිල්පයෙහි දක්ෂ බව
(5) යහපත් පැවතුම් ඇති බව

26. 'ධම්මකාමෝ භවං හෝති' යනු 'ධර්මය කැමති තැනැත්තා දියුණු වේ' යන අර්ථයයි. මෙම ප්‍රකාශය ඇතුළත් වන සූත්‍රය කුමක් ද?
(1) මහාමංගල (2) සිගාලෝවාද (3) ව්‍යග්ඝපජ්ජ (4) පරාභව (5) වසල

27. බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයන්ගේ දක්ෂතා හඳුනාගෙන ඒවා ඇගයීමට උත්සාහ කළහ. අග්‍ර තනතුරු ප්‍රදානය මීට උදාහරණයක් ලෙස දැක්විය හැකි ය. ඒ අනුව ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණත්ව හැකියාවන් ඇති ශ්‍රාවක ශ්‍රාවිකාවන් වෙත අග්‍ර තනතුරු ප්‍රදානය කිරීමෙන් ප්‍රදර්ශනය වන්නේ බුදුරජාණන් වහන්සේගේ,
(1) නම්‍යශීලී ගුණයයි.
(2) මහාකරුණාවයි.
(3) විශිෂ්ට ශාස්තෘත්වයයි.
(4) අනභිමානී බවයි.
(5) යථාවාදී තථාකාරී බවයි.

28. ධුතාංගධාරීන් අතර අග්‍ර වූයේ ............................ මහරහතන් වහන්සේ ය.
(1) මහාකාශ්‍යප
(2) අනුරුද්ධ
(3) කොණ්ඩඤ්ඤ
(4) උපාලි
(5) මහාකච්චාන

29. සුනාපරන්ත ප්‍රදේශයට වැඩම කොට දරුණු වර්ගයා ඇතුළු ප්‍රදේශවාසීන් සත්පුරුෂ කිරීමට කටයුතු කළේ,
(1) සැරියුත් හිමියන් ය.
(2) මුගලන් හිමියන් ය.
(3) පුණ්ණමන්තානිපුත්ත හිමියන් ය.
(4) මහාකාශ්‍යප හිමියන් ය.
(5) කොණ්ඩඤ්ඤ හිමියන් ය.

30. ප්‍රථම ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස **නොසැලකිය** හැකි කරුණ කුමක් ද?
(1) ක්ෂුද්‍රානුක්ෂුද්‍රක ශික්ෂා පද වෙනස් නොකිරීමට තීරණය කිරීම
(2) ධර්ම විනය ශාස්තෘත්වයෙහිලා සැලකීමට තීරණය කිරීම
(3) බුදුරදුන් විසින් දේශනා කරන ලද ධර්මය නිකාය පහක් යටතේ සංග්‍රහ කිරීම
(4) භික්ෂු-භික්ෂුණී විනය, ග්‍රන්ථ පහක් යටතේ සංග්‍රහ කිරීම
(5) ධර්ම විනය සුරක්ෂිත කිරීමේ වගකීම භාණකානුශිෂ්‍ය පරම්පරා වෙත පැවරීම

31. වජ්ජිපුත්තක භික්ෂූන් විසින් යස හිමියන්ට පටිසාරණීය හා උක්ඛේපනීය කර්ම සිදුකොට දඬුවම් පනවන ලද්දේ,
(1) දස වස්තුව විනය විරෝධී බව පැවසීම හේතුවෙනි.
(2) කාලාශෝක රජුට වජ්ජිපුත්තක භික්ෂූන්ගේ විනය විරෝධී ක්‍රියා දැනුම් දීම හේතුවෙනි.
(3) භික්ෂූන්ට මුදල් නොදෙන ලෙස විශාලා මහනුවර වැසියන් දැනුවත් කිරීම හේතුවෙනි.
(4) මුදල් සම්මාදම් කිරීමට විරුද්ධ වීම හේතුවෙනි.
(5) වජ්ජිපුත්තක භික්ෂූන්ට එරෙහිව සංඝයාට චෝදනා ඉදිරිපත් කිරීම හේතුවෙනි.

32. අශෝක රජතුමා විසින් සිදුකළ නිශ්චිත කටයුත්තක් සඳහා ඇමතිවරයෙකු පත් කොට භික්ෂූන් හමුවට පිටත්කර හරින ලද බවත්, එම ඇමතිවරයා විසින් තම උත්සාහය අසාර්ථක වීම නිසා භික්ෂූන් ඝාතනය කළ බවත් ඓතිහාසික වාර්තාවල සඳහන් වේ. අශෝක රජතුමා විසින් මෙම ඇමතිවරයා පත් කරන ලද්දේ,

(1) භික්ෂූන් විනය කර්ම නොකිරීමට හේතු සොයා බැලීමටයි.
(2) විනය සම්බන්ධයෙන් භික්ෂූන් අතර පැවති වාද-විවාද සමථයට පත් කිරීමටයි.
(3) භික්ෂූන්ගේ විනය විරෝධී කටයුතු පාලනය කිරීමටයි.
(4) භික්ෂූන් ධර්ම විනය වැරදි ලෙස අර්ථකථනය කිරීමට හේතු සොයා බැලීමටයි.
(5) සීලකාමී භික්ෂූන්ගේ කටයුතුවලට බාධා කළ අවිනයවාදීන් මැඩ පැවැත්වීමටයි.

33. මිනිස් ඝාතන හේතුවෙන් කම්පාවට පත් වූ අශෝක රජු දිග්විජය ප්‍රතිපත්තිය හැර දමා ධර්මවිජය ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට පෙළඹුණු බව සඳහන් වන ශිලා ලිපිය කුමක් ද?

(1) මස්කි (2) ගිර්නාර් (3) කාල්සි (4) භාබ්‍රු (5) බ්‍රහ්මගිරි

34. කනිෂ්ක රජතුමා විසින් බුදුසමයේ චිරස්ථිතිය පිණිස සිදු කරන ලද සේවාවන් කිහිපයක් පහත සඳහන් ප්‍රකාශවල අන්තර්ගත වේ.

A - සිව්වන ධර්ම සංගායනාවට අනුග්‍රහ දැක්වීම
B - දුසිල් භික්ෂූන් සසුනෙන් නෙරපා ශාසන ශෝධනයක් සිදු කිරීමට පියවර ගැනීම
C - ධර්මය තඹපත්වල ලියා ශෛලමය මංජුසාවක බහා එය නිදන්කොට මහාසෑයක් ඉදි කිරීම
D - කාසිවලට බුදුරුව ඇතුළත් කිරීම
E - ධර්ම මහාමාත්‍යවරුන් පත්කොට භාරතය තුළ හා භාරතයෙන් පිටත ධර්ම ප්‍රචාරයට කටයුතු කිරීම

නිවැරදි ප්‍රකාශ තුන ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B සහ C (2) A, C සහ D (3) B, C සහ D (4) B, D සහ E (5) C, D සහ E

35. පුරාණ භාරතීය අධ්‍යාපන ආයතන තුළ ක්‍රියාත්මක වූ ඉගැනුම් ක්‍රම ශිල්ප පහත පරිදි දැක්වේ.

A - විවාද ක්‍රමය
B - සාකච්ඡා ක්‍රමය
C - පැවරුම් ක්‍රමය
D - දේශනා ක්‍රමය
E - සම්මන්ත්‍රණ ක්‍රමය

මෙම ඉගැනුම් ක්‍රම ශිල්ප අතුරින් නාලන්දා විශ්වවිද්‍යාලයේ භාවිත වූ ඉගැනුම් ක්‍රම ශිල්ප ඇතුළත් වරණය තෝරන්න.

(1) A, B සහ C (2) A, B සහ D (3) A, C සහ E (4) B, C සහ D (5) B, C සහ E

36. ප්‍රාග් බෞද්ධ ලක්දිව පැවති ආගමික ඇදහිලි හා විශ්වාසවලට ගරු කළ පණ්ඩුකාභය රජතුමා සිය ගෙ උයන තුළම දෙවොලක් ඉදිකර දුන්නේ,

(1) කාලවේල යක්ෂයාට ය.
(2) චිත්තරාජ යක්ෂයාට ය.
(3) වළවාමුඛී යක්ෂණියට ය.
(4) පශ්චිම රාජිනී යක්ෂණියට ය.
(5) මහේජ යක්ෂයාට ය.

37. අනුරාධපුර යුගයේ මහාවිහාරයේ හා අභයගිරියේ වැඩ සිටි භික්ෂූන්ගේ ශාසනික සේවා කිහිපයක් පහත දැක්වේ.

A - ස්වාභාවික විපත් සමයන්හිදී පවා දිවි පරදුවට තබා බුදුදහම ආරක්ෂා කිරීම.
B - ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙහිලා පුරෝගාමී වීම
C - නව ශාසනික ප්‍රවණතා පිළිබඳ අවදියෙන් සිට ප්‍රගතිශීලීව කටයුතු කිරීම
D - අපූර්ව ග්‍රන්ථ සම්පාදනයෙහිලා පුරෝගාමී මෙහෙවරක් ඉටු කිරීම
E - නව ආගමික සංකල්ප හඳුන්වා දෙමින් ආගමික භක්තිය වැඩි දියුණු කිරීමට පුරෝගාමීව කටයුතු කිරීම

ඉහත ශාසනික සේවා අතුරින් අභයගිරි සම්ප්‍රදායට වඩාත් අදාළ වන ශාසනික සේවා දෙක ඇතුළත් වරණය කුමක් ද?

(1) A සහ B (2) B සහ C (3) C සහ D (4) C සහ E (5) D සහ E

38. පැරණි ලක්දිව රාජ්‍ය පාලනය හා බුද්ධාගම සම්බන්ධව පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) බ්‍රාහ්මණ පූජකයින් සතුව පැවති පුරෝහිත තනතුරේ වගකීම් බෞද්ධ භික්ෂූන්ට හිමි විය.
(2) ඇතැම් අනුරාධපුර රජවරුන්ගේ ශාසනික ප්‍රදානයන් හේතුකොට ගෙන ශ්‍රී ලාංකේය සංඝ සමාජය තුළ භේද ඇති විය.
(3) වලගම්බා රජු හා ඔහුගේ සෙනෙවියන් අතර ඇති වූ ගැටුම් කුපික්කල මහාතිස්ස හිමියගේ මැදිහත් වීමෙන් සමථයකට පත් විය.
(4) භික්ෂූන්ගේ මැදිහත් වීමෙන් ඔටුන්න හිමි ලජ්ජිතිස්සට එය අහිමි කොට ථූලත්ථන අභිෂේක කරවීය.
(5) දුටුගැමුණු රජු තුන් නිකාය සමගි කරවා ශාසන ශෝධනයක් සිදු කළේ ය.

39. මහසෙන් රජතුමා විසින් ඉදිකරන ලද ජේතවන සම්ප්‍රදායට අයත් වූ ප්‍රකට විහාරය හැඳින්වෙන්නේ,
(1) ඉසුරුමුණි විහාරය නමිනි.
(2) දක්ඛිණගිරි විහාරය නමිනි.
(3) ප්‍රාචීනාරාමය නමිනි.
(4) ලංකාරාමය නමිනි.
(5) වෙස්සගිරි විහාරය නමිනි.

40. ජේතවනයෙහි රජ වන් බුදුරජාණන් වහන්සේගේ පාත්‍රය හා සිවුර රකින්නට කම් සඳහන් කරමින් ක්‍රි.ව. 10 වන සියවසේදී ශිලා ලේඛනයක් පිහිටුවන ලද්දේ ............................ රජු විසිනි.
(1) IVවන මිහිඳු
(2) කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල
(3) කීර්ති ශ්‍රී මේඝවර්ණාභය
(4) IVවන අග්බෝ
(5) දුටුගැමුණු

41. බුදුරජාණන් වහන්සේ ජීවමාන සමය තුළදීම බුරුමයට බුද්ධාගම සම්ප්‍රාප්ත වූ බවට එරටෙහි ප්‍රකට ජනප්‍රවාද කිහිපයක් පවතී. එවැනි ජනප්‍රවාදයක් ලෙස **නොගැළපෙන** ප්‍රකාශය වන්නේ,
(1) බුරුම ජනතාව බුදුරදුන් වෙනුවෙන් සඳුන් දැවයෙන් ආරාමයක් ඉදි කළ බවයි.
(2) තපස්සු භල්ලුක වෙළෙඳුන් බුදුරදුන්ගේ කේශ ධාතු තැන්පත් කොට ස්තූපයක් ඉදි කළ බවයි.
(3) බුරුමයේ ඇතැම් රාජවංශ ශාක්‍ය වංශිකයන්ගෙන් පැවත එන බවයි.
(4) සෝණ හා උත්තර යන භික්ෂූන්ගේ ආරාධනාවක් අනුව බුදුරදුන් බුරුමයට වැඩම කළ බවයි.
(5) ධඤ්ඤවතී නුවර චන්ද්‍රසූර්ය රජුගේ ආරාධනාවකට අනුව බුදුරදුන් බුරුමයට වැඩම කළ බවයි.

42. බුරුම බුද්ධාගමේ සමෘද්ධිය පිණිස බලපාන ලද ප්‍රධාන සාධකයක් වූයේ ත්‍රිපිටකය බුරුම බසට පරිවර්තනය වීමයි. එසේ බුරුම බසට පරිවර්තනය කිරීම සඳහා අනුග්‍රහය සපයන ලද රජතුමා වන්නේ,
(1) කොයංසිත්ථ ය.
(2) නරපතිසිතු ය.
(3) මින්දොන් මින් ය.
(4) ධම්මචේතිය ය.
(5) අනුරුද්ධ ය.

43. පහත සඳහන් ප්‍රකාශ අතුරින් තායිලන්තයේ තාවකාලික පැවිද්ද හා සම්බන්ධ **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) පැවිදිවීම උත්සවශ්‍රීයෙන් සිදු කරනු ලබයි.
(2) උපැවිදිවීම ද උත්සවශ්‍රීයෙන් සිදු කරනු ලබයි.
(3) විසි වයස් සපිරූ තරුණයන් කෙටි කාලයකට හෝ පැවිදිවීම චිරාගත සම්ප්‍රදායකි.
(4) තාවකාලික පැවිද්ද විවාහයට විශේෂ සුදුසුකමකි.
(5) තාවකාලික පැවිද්ද රැකියා ලැබීමට විශේෂ සුදුසුකමකි.

44. ශ්‍රී ලංකාවෙන් චීනයට වැඩම කළ දේවසාරා භික්ෂුණිය ඇතුළු භික්ෂුණීන් කණ්ඩායම විසින් ක්‍රි.ව. 433 දී පමණ චීනයේ භික්ෂුණී ශාසනය ප්‍රතිෂ්ඨාපනය කළ බව ඓතිහාසික වාර්තාවලින් පැහැදිලි වේ. මෙම භාරදූර කටයුත්ත වෙනුවෙන් සහයෝගය ලබා දුන් භික්ෂූන් වහන්සේ වූයේ,
(1) සංඝවර්මන් ය.
(2) බෝධිධර්ම ය.
(3) කුමාරජීව ය.
(4) ගුණපාලන් ය.
(5) ෆාහියන් ය.

45. සෙන් බුද්ධාගමේ ආභාසයෙන් ජපන් සංස්කෘතියේ සෑම ක්ෂේත්‍රයකම ප්‍රබල පරිවර්තනයක් සිදු වූ බව පිළිගැනේ. එරට සාම්ප්‍රදායික සටන් කලාව තුළ ද මෙම පරිවර්තනය දැක ගත හැකි වේ. ජපානයේ එම සටන් කලාව ............................ නමින් හැඳින්වේ.
(1) කුජුකි
(2) මුන්රකු
(3) සමුරායි
(4) පුබියේ
(5) ඉකෙබානා

46. මහායාන බුද්ධාගම පැතිර ගිය රටවල බහුලව දක්නට ලැබෙන බුද්ධ ප්‍රතිමා කලාව තුළ භාවිත සුවිශේෂ ආසන ක්‍රමයක් වූ වජ්‍රාසනයෙන් නිරූපණය වන්නේ,

(1) සමාධියයි. (2) උපේක්ෂාවයි. (3) මෛත්‍රියයි.
(4) මහාකරුණාවයි. (5) වීර්යයයි.

47. භාරතීය ස්තූප කලාවේ සමාරම්භය පිළිබඳ විද්වතුන් අතර විවිධ මත දක්නට ලැබෙන අතර ස්තූප ශ්මශානයන්ගෙන් ප්‍රභවය වූ බව ප්‍රකාශ කරන ලද්දේ ........................................ විසිනි.

(1) ඒ.එම්. හෝකාට් (2) වී.එස්. අග්‍රවාල් (3) ජෝන් මාර්ෂල්
(4) රෝලන්ඩ් සිල්වා (5) පර්ගිසන්

48. සඳකඩපහණේ එක් පෙළට ගමන් කරන සතුන් හතර දෙනාගෙන් සතර දිශාව සංකේතවත් වන බව ප්‍රකාශ කරන ලද්දේ,

(1) එච්.සී.පී. බෙල් විසිනි. (2) ඩී.ටී. දේවේන්ද්‍ර විසිනි.
(3) විනී විතාරණ විසිනි. (4) විලියම් ජී. වෝඩ් විසිනි.
(5) වින්සන්ට් ස්මිත් විසිනි.

49. අනුරාධපුරයේ දක්නට ලැබෙන බොහෝ ........................................ ශීර්ෂය මකර මුඛයකින් නිකුත් වන ලියවැලක විලාසය ගත් අතර එම ලියවැල කෙළවර වන්නේ විශාල වෘත්තාකාර දසරයක් හෙවත් සංඛ පුල්ලිතාකාරණයකින් ය.

(1) මුරගල්වල (2) වාහල්කඩවල (3) පියගැටපෙළවල
(4) කොරවක්ගල්වල (5) සඳකඩපහණ්වල

50. ජාතක කථා, බුද්ධ චරිතය, ශ්‍රී ලාංකේය ශාසන ඉතිහාසය මෙන්ම ත්‍රිවිධ චෛත්‍යය හා බැඳුණු පූජනීය වස්තූන් මුල්කර ගනිමින් සම්භාව්‍ය සිංහල සාහිත්‍ය කෘති සමුදායක් බිහි වී තිබේ. හෙළයේ මහා කාව්‍යය ලෙස සම්භාවනාවට ලක්ව ඇති 'කව්සිළුමිණ' ද එබඳු සාහිත්‍ය කෘතියකි. එම සාහිත්‍ය කෘතිය සඳහා තේමා වී ඇත්තේ,

(1) බුද්ධ චරිතයයි. (2) ත්‍රිවිධ රත්නයයි. (3) ගුත්තිල ජාතකයයි.
(4) සත්තුභත්ත ජාතකයයි. (5) කුස ජාතකයයි.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

45 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

※ **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

1. (i) ක්ෂත්‍රිය වර්ණයට අයත් ස්වධර්ම **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි.)
   (ii) බ්‍රාහ්මණ ඉගැන්වීම්වල එන යාග ක්‍රම **තුනක්** කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03යි.)
   (iii) බ්‍රාහ්මණ සම්ප්‍රදාය තුළ භාරතීය කාන්තාවගේ නිදහස සීමා කර තිබූ බවට සාධක **හතරක්** සැකෙවින් දක්වන්න. (ලකුණු 04යි.)
   (iv) මක්ඛලී ගෝසාලගේ ආගමික ඉගැන්වීම් විධිමත්ව පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)
   (v) මක්ඛලී ගෝසාලගේ ඉගැන්වීම් බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් විචාරයට ලක් කරන්න. (ලකුණු 06යි.)

2. (i) 'විජ්ජාචරණ සම්පන්න' බුදු ගුණයට අයත් චරණ ධර්ම **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි.)
   (ii) බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03යි.)
   (iii) බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රඥාව සාධක **හතරක්** ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 04යි.)
   (iv) ආදර්ශවත් බෞද්ධ උපාසකයකු වූ චිත්ත ගෘහපතිතුමාගේ චරිතය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 05යි.)
   (v) යහපත් පාලන තන්ත්‍රයක් ගොඩනගා ගැනීමෙහිලා සප්ත අපරිහානීය ධර්මවලින් ලැබිය හැකි පිටිවහල කොතෙක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)

3. (i) "තණ්හාය ජායතී සෝකෝ" යන ධම්ම පද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 02යි.)
   (ii) ඉහත 3 (i) හි සඳහන් ගාථාවේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 03යි.)
   (iii) සිගාලෝවාද සූත්‍රයේ එන ස්වාමි-භාර්යා යුතුකම් හා වගකීම් **දහය** නම් කරන්න. (ලකුණු 04යි.)
   (iv) ගිහි ජීවිතය සාර්ථක කර ගැනීමට අදාළ මංගල කරුණු **පහක්** විස්තර කරන්න. (ලකුණු 05යි.)
   (v) අසීමිත ආශාව වෙනුවට අල්පේච්ඡ ජීවිතයක කාලීන වැදගත්කම බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් විවරණය කරන්න. (ලකුණු 06යි.)

## II කොටස

4. (i) ගුණගරුක සමාජයක් ගොඩනැගීමෙහිලා දස පින්කිරියවත් අදාළ කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න.
(ලකුණු 10යි.)

(ii) ඉද්ධියේ ප්‍රභේද පැහැදිලි කොට බෞද්ධ ප්‍රතිපදාව පිරීමට ඉද්ධිය පදනම් වන ආකාරය විස්තර කරන්න.
(ලකුණු 10යි.)

5. (i) ලෞකික ජීවිතයේ පරමාර්ථය ආර්ථික සමෘද්ධිය පමණක් නොවන බව චතුර්විධ සැපය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් පහදා දෙන්න.
(ලකුණු 10යි.)

(ii) ස්වච්ඡන්දතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පුද්ගලයා තුළ ආත්ම විශ්වාසය ගොඩනැංවීම පිණිස ඉවහල් වන බව පෙන්වා දෙන්න.
(ලකුණු 10යි.)

6. (i) ධර්මය සන්නිවේදනයෙහිලා බුදුරජාණන් වහන්සේ භාවිත කළ සන්නිවේදන ක්‍රම ශිල්ප උදාහරණ සහිතව විස්තර කරන්න.
(ලකුණු 10යි.)

(ii) තෙවන ධර්ම සංගායනාවට තුඩුදුන් හේතු සැකෙවින් දක්වා බුදුසමයේ චිරස්ථිතිය විෂයයෙහි එහි ප්‍රතිඵල හේතු වූ අයුරු විමසන්න.
(ලකුණු 10යි.)

7. (i) ප්‍රාග් බෞද්ධ යුගයේ ශ්‍රී ලාංකේය ජනතාව අතර ප්‍රචලිතව පැවති ඇදහිලි හා විශ්වාස නිදසුන් මගින් ප්‍රකට කරන්න.
(ලකුණු 10යි.)

(ii) ශ්‍රී ලාංකික ජන සමාජයේ ගුණ ධර්ම පෝෂණයට මහින්දාගමනයෙන් සිදු වූ බලපෑම ප්‍රමාණ කරන්න.
(ලකුණු 10යි.)

8. (i) ගන්ධාර හා මථුරා බුද්ධ ප්‍රතිමා සම්ප්‍රදායයන්හි ලක්ෂණ කෙටියෙන් හඳුන්වා ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමාවේ සුවිශේෂතා පෙන්වා දෙන්න.
(ලකුණු 10යි.)

(ii) පහත සඳහන් මාතෘකා අතරින් **දෙකකට** ප්‍රමාණවත් සටහන් ලියන්න.

(1) චේතියඝර

(2) පටිමාඝර

(3) මුරගල

(4) කොරවක්ගල

(ලකුණු 05 × 2 = 10යි.)

* * *

SHOT ON OPPO

1046

AL/2022(2023)/45/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

45 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකටම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

1. (i) ක්ෂත්‍රිය වර්ණයට අයත් ස්වධර්ම **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි.)
   (ii) බ්‍රාහ්මණ ඉගැන්වීම්වල එන යාග ක්‍රම **තුනක්** කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03යි.)
   (iii) බ්‍රාහ්මණ සම්ප්‍රදාය තුළ භාරතීය කාන්තාවගේ නිදහස සීමා කර තිබූ බවට සාධක **හතරක්** සැකෙවින් දක්වන්න. (ලකුණු 04යි.)
   (iv) මක්ඛලී ගෝසාලගේ ආගමික ඉගැන්වීම් විධිමත්ව පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)
   (v) මක්ඛලී ගෝසාලගේ ඉගැන්වීම් බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් විචාරයට ලක් කරන්න. (ලකුණු 06යි.)

2. (i) 'විජ්ජාචරණ සම්පන්න' බුදු ගුණයට අයත් චරණ ධර්ම **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි.)
   (ii) බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03යි.)
   (iii) බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රඥාව සාධක **හතරක්** ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 04යි.)
   (iv) ආදර්ශවත් බෞද්ධ උපාසකයකු වූ චිත්ත ගෘහපතිතුමාගේ චරිතය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 05යි.)
   (v) යහපත් පාලන තන්ත්‍රයක් ගොඩනගා ගැනීමෙහිලා සප්ත අපරිහානීය ධර්මවලින් ලැබිය හැකි පිටිවහල කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)

3. (i) "තණ්හාය ජායතී සෝකෝ" යන ධම්ම පද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 02යි.)
   (ii) ඉහත 3 (i) හි සඳහන් ගාථාවේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 03යි.)
   (iii) සිඟාලෝවාද සූත්‍රයේ එන ස්වාමි-භාර්යා යුතුකම් හා වගකීම් **දහය** නම් කරන්න. (ලකුණු 04යි.)
   (iv) ගිහි ජීවිතය සාර්ථක කර ගැනීමට අදාළ මංගල කරුණු **පහක්** විස්තර කරන්න. (ලකුණු 05යි.)
   (v) අසීමිත ආශාව වෙනුවට අල්පේච්ඡ ජීවිතයක කාලීන වැදගත්කම බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් විවරණය කරන්න. (ලකුණු 06යි.)

[ දෙවැනි පිටුව බලන්න

## II කොටස

4. (i) ගුණගරුක සමාජයක් ගොඩනැගීමෙහිලා දස පින්කිරියවත් අදාළ කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

(ii) ශ්‍රද්ධාවේ ප්‍රභේද පැහැදිලි කොට බෞද්ධ ප්‍රතිපදාව පිරීමට ශ්‍රද්ධාව පදනම් වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 10යි.)

5. (i) ලෞකික ජීවිතයේ පරමාර්ථය ආර්ථික සමෘද්ධිය පමණක් නොවන බව චතුර්විධ සැපය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් පහදා දෙන්න. (ලකුණු 10යි.)

(ii) ස්වච්ඡන්දතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම පුද්ගලයා තුළ ආත්ම විශ්වාසය ගොඩනැංවීම පිණිස ඉවහල් වන බව පෙන්වා දෙන්න. (ලකුණු 10යි.)

6. (i) ධර්මය සන්නිවේදනයෙහිලා බුදුරජාණන් වහන්සේ භාවිත කළ සන්නිවේදන ක්‍රම ශිල්ප උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 10යි.)

(ii) තෙවන ධර්ම සංගායනාවට තුඩුදුන් හේතු සැකෙවින් දක්වා බුද්ධසමයේ චිරස්ථිතිය විෂයයෙහි එහි ප්‍රතිඵල හේතු වූ අයුරු විමසන්න. (ලකුණු 10යි.)

7. (i) ප්‍රාග් බෞද්ධ යුගයේ ශ්‍රී ලාංකේය ජනතාව අතර ප්‍රචලිතව පැවති ඇදහිලි හා විශ්වාස නිදසුන් මගින් ප්‍රකට කරන්න. (ලකුණු 10යි.)

(ii) ශ්‍රී ලාංකික ජන සමාජයේ ගුණ ධර්ම පෝෂණයට මිහින්දාගමනයෙන් සිදු වූ බලපෑම ප්‍රමාණ කරන්න. (ලකුණු 10යි.)

8. (i) ගන්ධාර හා මථුරා බුද්ධ ප්‍රතිමා සම්ප්‍රදායයන්හි ලක්ෂණ කෙටියෙන් හඳුන්වා ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමාවේ සුවිශේෂතා පෙන්වා දෙන්න. (ලකුණු 10යි.)

(ii) පහත සඳහන් මාතෘකා අතරින් **දෙකකට** ප්‍රමාණවත් සටහන් ලියන්න.

(1) චේතියඝර

(2) පටිමාඝර

(3) මුරගල

(4) කොරවක්ගල

(ලකුණු 05 × 2 =10 යි.)

* * *

WWW.PastPapers.WIKI
Sri Lanka Biggest past papers Bank